සියලු ම හිමිකම් ඇවිරිණි.

SRI LANKA

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර I විභාගය - 2025 ජූලි

## (101) මූල්‍ය ගිණුම්කරණය

(Financial Accounting)

2025-08-02
පෙරවරු
[09.00 – 12.00]

පිටු ගණන : 10
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

  (1) ***දී ඇති කාලය :*** *පැය 03 යි.*

  (2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

  (3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

  (4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

  (5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

  (6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

  (7) *ලකුණු 100 යි.*

---

## <u>A කොටස</u>

## වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 40)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** මූල්‍ය ගිණුම්කරණයේ අරමුණක් වන්නේ:

(1) ව්‍යාපාරයේ නිෂ්පාදිතවල විකුණුම් මිල තීරණය කිරීමයි.

(2) ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්වය අවබෝධ කර ගැනීම යි.

(3) සේවකයින්ගේ කාර්යසාධනය හඳුනා ගැනීම යි.

(4) ව්‍යාපාරයේ වියදම් අඩු කිරීමයි.

**1.2** පහත සඳහන් කාණ්ඩ අතුරෙන්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මූලිකාංග සමන්විත වන්නේ කුමන කාණ්ඩයේ ද?

(1) වත්කම්, වගකීම් සහ වියදම්.

(2) වත්කම්, වගකීම් සහ ආදායම්.

(3) වත්කම්, වගකීම් සහ ස්කන්ධය.

(4) වත්කම්, ස්කන්ධය සහ වියදම්.

**1.3** පහත සඳහන් ඒවා අතුරෙන්, මූල්‍ය තොරතුරුවල මූලික ගුණාත්මක ලක්ෂණයක් වන්නේ කුමක් ද?

(1) අඛණ්ඩ පැවැත්ම.

(2) අදාළ බව.

(3) උපචිත පදනම.

(4) රහස්‍යභාවය.

**1.4** ගනුදෙනුකරුවෙකුගේ බංකොලොත්භාවය හේතුකොටගෙන ණයගැතියන්ගෙන් රු.2,000/- ක මුදලක් බොල් ණයක් ලෙස කපා හරින ලදී. මේ සම්බන්ධයෙන් අදාල වන ගිණුම්කරණ සංකල්පය වන්නේ:

(1) ගැලපුම් සංකල්පයයි. (2) උපචිත සංකල්පයයි.

(3) අඛණ්ඩ පැවැත්ම පිළිබඳ සංකල්පයයි. (4) ඓතිහාසික පිරිවැය සංකල්පයයි.

**1.5** පහත සඳහන් තොරතුරු, 2025 මාර්තු මාසය සඳහා **ABC ට්‍රේඩර්ස්** හි පොත්වලින් උපුටා ගන්නා ලදී:

| | රු. |
|---|---:|
| 2025 මාර්තු 31 දිනට ශුද්ධ වත්කම් | 6,800,000 |
| 2025 මාර්තු 01 දිනට ශුද්ධ වත්කම් | 4,200,000 |
| මාසය තුළ සිදුකළ ගැනිලි | 500,000 |
| මාසය තුළදී යෙදවූ අමතර ප්‍රාග්ධනය | 400,000 |

ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව, 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ මාසය සඳහා ව්‍යාපාරයේ ශුද්ධ ලාභය වන්නේ:

(1) රු.2,700,000/-. (2) රු.1,700,000/-. (3) රු.1,800,000/-. (4) රු.2,500,000/-.

**1.6** කේවලස්වාමි ව්‍යාපාරයක, ගිණුම්කරණ සමීකරණයට ගනුදෙනුවකින් ඇතිවන බලපෑම පහත සඳහන් පරිදි ඔබ වෙත ලබාදී ඇත: (රු.)

| වත්කම් | | = | ස්කන්ධය | + | වගකීම් |
|---|---|---|---|---|---|
| තොගය + | මුදල් | | | | |
| - 35,000 | + 45,000 | = | +10,000 | | - |

ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව, ඉහත ගිණුම්කරණ සමීකරණය සඳහා වඩාත්ම ගැලපෙන ගනුදෙනුව, පහත සඳහන් ඒවා අතුරෙන් කුමක් ද?

(1) අයිතිකරු තම පෞද්ගලික ප්‍රයෝජනය සඳහා රු.45,000/- ක් වටිනා භාණ්ඩ ලබාගෙන ඇති අතර, එම භාණ්ඩවල පිරිවැය රු.35,000/- කි.

(2) පිරිවැය රු.35,000/- ක් වූ භාණ්ඩ, රු.45,000/- ක මුදලකට විකුණන ලදී.

(3) පිරිවැය රු.35,000/- ක් වූ භාණ්ඩ, රු.45,000/- කට ණයට විකුණන ලදී.

(4) පිරිවැය රු.45,000/- ක් වූ භාණ්ඩ, රු.35,000/- ක මුදලකට විකුණන ලදී.

**1.7** පහත සඳහන් ඒවා අතුරෙන්, වෙළෙඳ ණයහිමියෙකුට සිදුකළ ගෙවීමක් නිසා ගිණුම්කරණ මූලිකාංග මත වන නිවැරදි බලපෑම තෝරන්න:

(1) වත්කම් වැඩිවීම සහ වගකීම් වැඩිවීම. (2) වත්කම් අඩුවීම සහ ස්කන්ධය අඩුවීම.

(3) වත්කම් අඩුවීම සහ වගකීම් අඩුවීම. (4) වත්කම් වැඩිවීම සහ වගකීම් අඩුවීම.

**1.8** පහත සඳහන් ඒවා අතුරෙන්, පොදු ජර්නලයේ සටහන් කරනු ලබන්නේ කුමක් ද?

(1) නැවත විකිණීම සඳහා අත්පිට මුදලට භාණ්ඩ මිලදී ගැනීම.

(2) කාර්යාලයේ භාවිතය සඳහා කාර්යාල උපකරණයක් ණයට මිලදී ගැනීම.

(3) කාර්යාලයේ භාවිතය සඳහා අත්පිට මුදලට මෝටර් රථයක් මිලදී ගැනීම.

(4) නැවත විකිණීම සඳහා භාණ්ඩ ණයට මිලදී ගැනීම.

**1.9** ණයට මිලදී ගත් භාණ්ඩ නැවත හරවා යැවූ බවට වාර්තා කිරීම සඳහා ගැනුම්කරු විසින් භාවිත කරනු ලබන මූලාශ්‍ර ලියවිල්ල වන්නේ:

(1) හර පත.

(2) විකුණුම් ඉන්වොයිසිය.

(3) බැර පත.

(4) භාණ්ඩ ලැබීමේ පත්‍රිකාව [Goods Received Note (GRN)].

**1.10** පහත සඳහන් ප්‍රකාශන අතුරෙන්, ද්විත්ව සටහන් ගිණුම්කරණ ක්‍රමය සම්බන්ධයෙන් නිවැරදි වන්නේ කුමක් ද?

(1) සෑම ගනුදෙනුවක්ම එක් ගිණුමක පමණක් වාර්තා කරනු ලබයි.

(2) සෑම ගනුදෙනුවක්ම එක් ලෙජර් ගිණුමක දෙවරක් වාර්තා කළ යුතුය.

(3) සෑම ගනුදෙනුවක්ම මුදල් පදනම යටතේ වාර්තා කරනු ලැබේ.

(4) සෑම ගනුදෙනුවක්ම අවම වශයෙන් ගිණුම් දෙකක වාර්තා කරනු ලබයි.

*අංක 1.11 සිට 1.15 දක්වා ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය **සත්‍ය** හෝ **අසත්‍යදැයි** දක්වන්න. **සත්‍ය** හෝ **අසත්‍ය** යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.11** ව්‍යවසාය සම්පත් සැලසුම්කරණ පද්ධතියක් [Enterprise Resource Planning (ERP)] යනු තීරණ ගැනීමේ අවශ්‍යතාවය සඳහා අවශ්‍ය ඒකාබද්ධ තොරතුරු පද්ධතියක් ලෙස ක්‍රියාකරන පරිගණකගත පද්ධතියකි.

**1.12** ගොඩනැගිලි ගිණුම, නාමික / නාමමාත්‍ර ගිණුමක් සඳහා උදාහරණයකි.

**1.13** වගකීමක් යනු අතීත සිද්ධීන්වල ප්‍රතිඵලයක් ලෙස අස්තිත්වය විසින් පාලනය කරනු ලබන වර්තමාන ආර්ථික සම්පතකි.

**1.14** ඓතිහාසික පිරිවැය සංකල්පයට අනුව, වත්කම් අත්පත් කරගැනීමේ පිරිවැය හෝ ඉදිකිරීමේ පිරිවැය මත පදනම් කර ගනිමින්, අස්තිත්වයක වත්කම්වල වටිනාකම වාර්තා කරනු ලබයි.

**1.15** "යථාරූපී සංකල්පය / ආකෘතියට වඩා හරය හුවා දැක්වීම (Substance over form)" යන්නෙන් අදහස් වන්නේ ගනුදෙනු වාර්තා කළ යුත්තේ ඒවායේ ආර්ථික යථාර්ථය මත නොව ඒවායේ නීතිමය ස්වරූපය මත බවයි.

*අංක 1.16 සිට 1.20 දක්වා ඇති ප්‍රශ්නවලට උත්තර, ප්‍රශ්න අංක ද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.16** මුදල් පාලන ගිණුමේ (මුදල් පොත) ශේෂය සහ බැංකු ප්‍රකාශනයේ දැක්වෙන ශේෂය අතර ඇති විය හැකි කාල වෙනස්කම් (time differences) සඳහා හේතු දෙකක්(02) සඳහන් කරන්න.

**1.17** ජංගම වත්කමක් සහ ජංගම නොවන වත්කමක් අතර ඇති වෙනස සඳහන් කරන්න.

**1.18** පහත ගනුදෙනු වාර්තා කිරීම සඳහා භාවිත කරනු ලබන නිවැරදි මූලාශ්‍ර ලියවිල්ල හඳුනා දක්වන්න:

(1) ණයගැතියෙකුගෙන් රු.5,000/- ක මුදලක් ලැබීම.

(2) නැවත විකිණීම සඳහා රු.45,000/- ක් වටිනා භාණ්ඩ ණයට මිලදී ගැනීම.

**1.19** අස්තිත්වයකට ව්‍යාපාර ආචාරධර්ම වැදගත් වන්නේ ඇයිදැයි යන්නට හේතු දෙකක්(02) සඳහන් කරන්න.

**1.20** අස්තිත්වයක් සඳහා ගිණුම්කරණ සංකල්ප අවශ්‍ය වීමට හේතු දෙකක්(02) ලැයිස්තුගත කරන්න.

(එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 40)

### 02 වන ප්‍රශ්නය

**රජරට රූපින්,** විවිධ වර්ගවල උළු කැට නිෂ්පාදකයෙකු වන අතර, පහත සඳහන් තොරතුරු 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **රජරට රූපින්** හි ගිණුම් පොත්වලින් උපුටා ගන්නා ලදී:

| විස්තරය | රු. |
|---|---:|
| 2024 අප්‍රේල් 01 දිනට අමුද්‍රව්‍ය තොගය | 150,000 |
| වර්ෂය තුළදී මිලට ගත් අමුද්‍රව්‍ය | 5,250,000 |
| අමුද්‍රව්‍ය ගෙන ඒමේ කුලී | 250,000 |
| 2024 අප්‍රේල් 01 දිනට නොනිමි වැඩ (ප්‍රාථමික පිරිවැයට අගය කළ) | 180,000 |
| නිෂ්පාදන සේවකයින් සඳහා ඍජු වේතන | 1,900,000 |
| විදුලිය | 740,000 |
| ජලය | 250,000 |
| කර්මාන්තශාලාවේ ආරක්ෂක වියදම් | 360,000 |
| යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ වියදම් | 80,000 |
| කුලිය | 600,000 |
| ක්ෂය - පිරියත සහ යන්ත්‍ර | 200,000 |
| ක්ෂය - මොටර් ලොරි රථය | 540,000 |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2025 මාර්තු 31 දිනට පැවති අවසන් තොග ශේෂයන්, පහත පරිදි අගය කර ඇත:

| විස්තරය | (රු.) |
|---|---:|
| අමුද්‍රව්‍ය තොගය (පිරිවැයට) | 80,000 |
| නොනිමි වැඩ (ප්‍රාථමික පිරිවැයට අගය කර ඇත) | 160,000 |

(2) පහත සඳහන් වියදම්, පහත පරිදි බෙදා වෙන්කළ යුතුය:

| වියදම් | කර්මාන්තශාලාව | කාර්යාලය |
|---|---|---|
| විදුලිය | 60% | 40% |
| ජලය | 90% | 10% |
| කුලිය | 75% | 25% |

(3) නිෂ්පාදනය කරන ලද උළු කැට, නිෂ්පාදන පිරිවැය මත 18% ක ලාභයක් සහිතව වෙළෙඳ අංශයට මාරු කරනු ලබයි.

(4) පිරියත හා යන්ත්‍ර සහ මෝටර් ලොරි රථය සම්පූර්ණයෙන්ම කර්මාන්තශාලාවේ කටයුතු සඳහා යොදාගනු ලැබේ.

(5) ඍජු වේතනවලට අමතරව, නිෂ්පාදනය කරන ලද සෑම උළු කැටයක් සඳහාම නිෂ්පාදන සේවකයන්ට රු.5/- ක දිරි දීමනාවක් හිමිවන අතර, වර්ෂය තුළ උළු කැට 200,000 ක් නිෂ්පාදනය කරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා, **රජරට රූපින්** හි නිෂ්පාදන පිරිවැය ලේඛණය (නිෂ්පාදන ගිණුම) **පිළියෙල කරන්න.** (ලකුණු 10)

## 03 වන ප්‍රශ්නය

2024 අප්‍රේල් 01 දින **රිස්නි** විසින් මුදලින් රු.2,500,000/-, මූලික ප්‍රාග්ධනය ලෙස ආයෝජනය කරමින් ආරම්භ කරන ලද **රිස්නි ට්‍රේඩර්ස්,** තනි හිමිකාර ව්‍යාපාරයකි.

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් පාලන ගිණුමේ (මුදල් පොතේ) සාරාංශය පහත දැක්වේ:

**මුදල් පාලන ගිණුම (මුදල් පොත)**

| ලැබීම් | හර (රු.) | ගෙවීම් | බැර (රු.) |
|---|---|---|---|
| මූලික ප්‍රාග්ධන ආයෝජනය | 2,500,000 | අත්පිට ගැනුම් | 2,850,000 |
| වෙළෙඳ ණයගැතියන්ගෙන් ලැබීම් | 3,900,000 | වෙළෙඳ ණයහිමියන්ට ගෙවීම් | 2,250,000 |
| අත්පිට විකුණුම් | 4,800,000 | ස්ථාවර තැන්පතුවක ආයෝජනය | 500,000 |
| | | වැටුප් සහ වේතන | 800,000 |
| | | සුළු මුදල් පොතට මාරු කළ මුදල | 150,000 |
| | | බෙදාහැරීමේ වෑන් රථයක් මිලට ගැනීම (2025 ජනවාරි 01 දින මිලට ගන්නා ලදී) | 3,200,000 |
| | | විදුලිය සහ ජල වියදම් | 400,000 |
| | | දුරකතන සහ අන්තර්ජාල ගාස්තු | 300,000 |
| | | ප්‍රචාරණ වියදම් | 120,000 |
| | | කාර්යාල කුලිය | 400,000 |
| | | ප/ගෙ ශේෂය | 230,000 |
| | **11,200,000** | | **11,200,000** |
| ඉ/ගෙ ශේෂය | 230,000 | | |

(2) 2025 මාර්තු 31 දිනට ලැබිය යුතු සහ ගෙවිය යුතු ශේෂ පහත සඳහන් පරිදි වේ:

| | රු. |
|---|---|
| වෙළෙඳ ණයගැතියෝ | 1,900,000 |
| වෙළෙඳ ණයහිමියෝ | 2,500,000 |
| උපචිත දුරකතන සහ අන්තර්ජාල ගාස්තු | 15,000 |

(3) මෝටර් වාහන, සරල මාර්ග ක්‍රමයට පිරිවැය මත වාර්ෂිකව 20% බැගින් ක්ෂය කළ යුතුය.

(4) පහත සඳහන් වියදම්, සුළු මුදල් මගින් ගෙවා ඇත:

- ලිපිද්‍රව්‍ය : රු.12,500/-.
- ගමන් වියදම් : රු.7,500/-.
- අනියම් වේතන : රු.55,000/-.

(5) 2024 ඔක්තෝම්බර් 01 දින, 10% බැගින් වූ වාර්ෂික පොලී අනුපාතිකයක් යටතේ ස්ථාවර තැන්පතුවක් ආරම්භ කර ඇත. වර්ෂයට අදාල පොලිය, 2025 අප්‍රේල් 01 දින ලැබී තිබුණි.

(6) 2025 මාර්තු 31 දිනට, තොග කිසිවක් නොතිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2025 මාර්තු 31 දිනට, **රිස්නි ට්‍රේඩර්ස්** හි ශේෂ පිරික්සුම **පිළියෙළ කරන්න.** (ලකුණු 10)

## 04 වන ප්‍රශ්නය

**අමායා ස්ටෝර්ස්** හි සහකාර ගණකාධිකාරීවරයා විසින් 2025 මාර්තු 31 දිනට පිළියෙල කරන ලද ශේෂ පිරික්සුම එකඟ නොවිය. වෙනස වූ රු.33,100/- අවිනිශ්චිත ගිණුමට හර කර, කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලදී. **අමායා ස්ටෝර්ස්** විසින් වෙළෙඳ ලැබිය යුතු මුදල් සහ වෙළෙඳ ගෙවිය යුතු මුදල් සඳහා පාලන ගිණුම් පවත්වා ගෙන යනු ලබයි.

වෙනස සඳහා පහත සඳහන් හේතු, පසුව හඳුනාගන්නා ලදී:

(1) 2024 අප්‍රේල් 01 දින රු.60,000/- කට මිලට ගත් කාර්යාල උපකරණයක්, ගැනුම් ගිණුමේ වාර්තා කර ඇත. නමුත් මෙය නිවැරදිව මුදල් පොතේ සටහන් කර ඇත. කාර්යාල උපකරණ පිරිවැයට, සරල මාර්ග ක්‍රමයට වාර්ෂිකව 25% බැගින් ක්ෂය කරනු ලබන අතර, මෙම කාර්යාල උපකරණයට අදාල ක්ෂය අයකිරීම, ගිණුම් පොත්වල සටහන් තබා නොමැත.

(2) රු.4,000/- ක අත්පිට මිලට ගැනුම්, ගැනුම් ගිණුමේ සටහන් කර නොමැත. කෙසේවුවද, එය මුදල් පොතේ නිවැරදිව සටහන් තබා ඇත.

(3) රු.15,000/- ක කුලී වියදම්, වැරදීමකින් කුලී ආදායම් ගිණුමට බැර කොට ඇති අතර, එය මුදල් පොතේ නිවැරදිව සටහන් කර ඇත.

(4) 2025 මාර්තු මාසය සඳහා ගෙවිය යුතු රු.6,000/- ක දුරකතන බිල්පතක්, ලෙජර් ගිණුම් දෙකෙහිම දෙවරක් සටහන් කර තිබුණි.

(5) ගැනුම් ජර්නලයේ එකතුව රු.14,500/- ක් වැඩියෙන් සටහන් කර තිබුණි.

(6) රු.4,500/- ක විදුලි වියදම්, රු.5,400/- ක් ලෙස විදුලි වියදම් ගිණුමේ සටහන් කර ඇත. නමුත්, එය මුදල් පොතේ නිවැරදිව සටහන් කර තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) ඉහත සඳහන් වැරදි, නිවැරදි කිරීමට අවශ්‍ය ජර්නල් සටහන්. (ලකුණු 07)

(b) අවිනිශ්චිත ගිණුම. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

(A) **රවී**, 2025 මාර්තු 01 දින, සිල්ලර ව්‍යාපාරයක් ආරම්භ කරන ලද අතර, 2025 මාර්තු මාසය තුළදී පහත සඳහන් ගනුදෙනු සිදුවිය:

(1) **රවී** විසින් මූලික ප්‍රාග්ධනයක් ලෙස රු.500,000/- ක මුදලක් යොදවන ලදී.

(2) රු.150,000/- ක වටිනාකමින් යුත් කාර්යාල උපකරණයක් අත්පිට මුදලට මිලට ගන්නා ලදී.

(3) නැවත විකිණීම සඳහා රු.80,000/- ක් වටිනා භාණ්ඩ, **සීමාසහිත XYZ සමාගමෙන්** ණයට මිලදී ගන්නා ලදී.

(4) පිරිවැය රු.50,000/- ක් වූ භාණ්ඩ, රු.70,000/- කට ණයට විකුණන ලදී.

(5) මාසය තුළදී **රවී** විසින් රු.3,000/- ක ගැනිලි, මුදලින් සිදුකරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත සඳහන් එක් එක් ගනුදෙනුව මඟින්, පහත දැක්වෙන ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම **සඳහන් කරන්න.**

*[කාර්යාල උපකරණ + තොගය + ණයගැතියන් + මුදල් = ස්කන්ධය (ප්‍රාග්ධනය) + වගකීම්]* (ලකුණු 05)

(B) 2025 මාර්තු 31 දිනට, **ABC ට්‍රේඩර්ස්** හි බැංකු ප්‍රකාශනයේ රු.42,500/- ක වාසිදායක ශේෂයක් පෙන්වූ අතර, එදිනට මුදල් පාලන ගිණුමේ රු.26,500/- ක හර (වාසිදායක) ශේෂයක් පෙන්විය.

පසුව, ව්‍යාපාරයේ ගිණුම් විධායක විසින් බැංකු ප්‍රකාශනයේ ශේෂය සහ මුදල් පාලන ගිණුමේ ශේෂය අතර, වෙනසට පහත සඳහන් හේතු සටහන් කරගන්නා ලදි:

(1) 2025 මාර්තු 25 දින, රු.15,000/- ක චෙක්පතක් සැපයුම්කරුවෙකුට නිකුත් කර ඇති නමුත්, එය 2025 මාර්තු 31 දින වන විටත් ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත්කර නොතිබුණි.

(2) ගනුදෙනුකරුවෙකු විසින් රු.20,000/- ක මුදලක්, සෘජුවම **ABC ට්‍රේඩර්ස්** හි බැංකු ගිණුමේ තැන්පත් කොට ඇති අතර, මෙම මුදල, මුදල් පොතේ සටහන් කර නොතිබුණි.

(3) 2025 මාර්තු 28 දින, බැංකුව විසින් රු.1,000/- ක්, බැංකු ගාස්තුව ලෙස හරකොට ඇති අතර, එය මුදල් පොතේ සටහන් කර නොමැත.

(4) ගනුදෙනුකරුවෙකුගෙන් ලද රු.5,000/- ක චෙක්පතක්, 2025 මාර්තු 30 දින බැංකු ගිණුමට තැන්පත් කර ඇති නමුත් එය 2025 මාර්තු 31 දින වන විටත් උපලබ්ධි වී නොතිබුණි.

(5) ඉතුරුම් ගිණුමකින් ලද රු.2,000/- ක පොලී ආදායම, බැංකු ගිණුමට බැරකර ඇත. නමුත්, එය මුදල් පොතේ සටහන් කර නොතිබුණි.

(6) බැංකුවෙන් ලබාගත් ණය මුදලට අදාලව, බැංකුව විසින් රු.15,000/- ක ණය වාරිකය අඩුකර ඇති අතර, මෙය මුදල් පොතේ සටහන් කර නොතිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) ගලපන ලද මුදල් පාලන ගිණුම (මුදල් පොත). (ලකුණු 03)

(b) 2025 මාර්තු 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස
(මුළු ලකුණු 20)

## 06 වන ප්‍රශ්නය

**තාතත් ට්‍රේඩර්ස්, තාතත්** ට අයිතිව ඇති කේවලස්වාමි ව්‍යාපාරයක් වන අතර, 2025 මාර්තු 31 දිනට **තාතත් ට්‍රේඩර්ස්** හි ශේෂ පිරික්සුම පහත පරිදි වේ:

**තාතත් ට්‍රේඩර්ස්**

**2025 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම** *(රු.'000)*

| විස්තරය | හර | බැර |
|---|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ - පිරිවැයටට: | | |
| ඉඩම සහ ගොඩනැගිලි (ඉඩමේ වටිනාකම - රු.2,400,000/-) | 8,400 | |
| ගෘහ භාණ්ඩ | 4,000 | |
| මෝටර් වාහන | 2,500 | |
| 2024 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය: | | |
| ගොඩනැගිලි | | 600 |
| ගෘහ භාණ්ඩ | | 1,000 |
| මෝටර් වාහන | | 625 |
| විකුණුම් | | 119,680 |
| ගැනුම් | 74,500 | |
| 2024 අප්‍රේල් 01 දිනට තොගය | 9,500 | |
| අතැති මුදල් සහ බැංකුවේ ඇති මුදල් | 310 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 12,080 | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | | 8,120 |
| බැංකු ණය | | 3,000 |
| වැටුප් සහ වේතන | 18,400 | |
| අළුත්වැඩියා සහ නඩත්තු වියදම් | 900 | |
| දුරකතන සහ ජල ගාස්තු | 750 | |
| ගෙවන ලද ගබඩා කුළිය | 1,650 | |
| ආරක්ෂක ගාස්තු | 550 | |
| රක්ෂණ වියදම් | 120 | |
| විදුලි වියදම් | 1,280 | |
| කාර්යාල වියදම් | 1,350 | |
| ගමන් සහ ප්‍රවාහන වියදම් | 1,220 | |
| 2024 අප්‍රේල් 01 දිනට, ප්‍රාග්ධන ගිණුම | | 4,485 |
| **එකතුව** | **137,510** | **137,510** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2025 මාර්තු 31 දිනට අවසාන තොගය, රු.5,200,000/- ක පිරිවැයට අගය කරන ලදී.

(2) 2025 ජනවාරි 01 දින සිට 2025 දෙසැම්බර් 31 දක්වා කාලය සඳහා, ගිනි රක්ෂණ ඔප්පුවක් 2025 ජනවාරි 01 දින ලබාගන්නා ලදී. මේ සඳහා වන සම්පූර්ණ මුදල වූ රු.120,000/-, රක්ෂණ වියදම් ගිණුමට හර කරන ලදී.

(3) 2024 ඔක්තෝම්බර් 01 දින, 12% ක වාර්ෂික පොලී අනුපාතිකයක් යටතේ රු.3,000,000/- ක ණය මුදලක් බැංකුවෙන් ලබාගෙන ඇත. ණය මුදලෙහි ප්‍රාග්ධන ආපසු ගෙවීම, 2025 අප්‍රේල් 01 දින ආරම්භ කරන ලදී. 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂයට අදාල ගෙවිය යුතු ණය පොලිය, ගිණුම් පොත්වල සටහන් කර නොමැත.

(4) ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වන්නේ, පහත සඳහන් පරිදි පිරිවැය මත, සරල මාර්ග ක්‍රමයට ක්ෂය සඳහා ප්‍රතිපාදනය කිරීමයි:

| | | |
|---|---|---|
| ගොඩනැගිලි | : | වර්ෂයකට 05% බැගින් |
| ගෘහ භාණ්ඩ | : | වර්ෂයකට 20% බැගින් |
| මෝටර් වාහන | : | වර්ෂයකට 25% බැගින් |

(5) 2025 මාර්තු මාසය සඳහා ගබඩාවේ කුලිය වූ රු.150,000/-, 2025 මාර්තු 31 දින වන විටත් ගෙවා නොතිබුණි.

(6) **නාතන්** විසින් රු.80,000/- ක මුදලක්, බොල් ණය වශයෙන් ලියා හැරීමටත්, 2025 මාර්තු 31 දිනට ඉතිරි වෙළෙඳ ලැබිය යුතු මුදල් ශේෂයෙන් 2% ක ප්‍රතිපාදනයක් සිදු කිරීමටත් තීරණය කරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය. (ලකුණු 12)

(b) 2025 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 08)

(මුළු ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | අඳින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | හඳුනා දක්වන්න | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | හඳුනාගන්න | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | අර්ථකතනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | පැහැදිලි කරන්න | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැළපීම. | සසඳන්න | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | පිළියෙල කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |